**#mediaethicsSL #SinhalaPress #EnglishPress #lka #CeylonToday #Mawbima #January18**
පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්දිරන් මහතා විසින් මව්බිම සහ සිලෝන් ටුඩේ ඇතුළු මාධ්‍ය කීපයක් පිළිබඳව කරනු ලැබූ ප්‍රකාශයක් සම්බන්ධයෙන් මව්බිම සහ සිලෝන් ටුඩේ පුවත්පත් තුළ සඳහන් කර ඇති ආකාරය වෙත අපගේ අවධානය යොමු විණි.

යාපනයේ පැවැත්වුණු රැස්වීමකදී පාර්ලිමේන්තු මන්ත්‍රී සුමන්දිරන් විසින් පවසා සිටියේ, තමන් ප්‍රකාශ කළ බවට උක්ත පුවත්පත් මගින් පළ කරනු ලැබූ පුවත සාවද්‍ය බවයි. මව්බිම සහ සිලෝන් ටුඩේ පුවත්පත් මගින් ප්‍රති පිළිතුරු දී ඇත්තේ එම ප්‍රකාශයටයි.

මෙහි දී කරුණු දෙකක් වෙත අවධානය යොමු කළ යුතු වේ. මාධ්‍යවේදීන් සඳහා ශ්‍රී ලංකා කතෘ සංසදය මගින් නිකුත් කොට තිබෙන ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව, පුවත්පතක් යම් පුද්ගලයකු සම්බන්ධයෙන් කරන ප්‍රකාශයකට පිළිතුරු දීමේ සාධාරණ අවස්ථාවක් එම පුද්ගලයා වෙත ලබා දිය යුතු වේ. පාර්ලිමේන්තු මන්ත්‍රී සුමන්දිරන් විසින් යාපනයේ රැස්වීමකදී කළ මෙම ප්‍රකාශය ද සිලෝන් ටුඩේ සහ මව්බිම පුවත්පත් වාර්තාවන් වෙත පිළිතුරු දීමට ගත් අවස්ථාවක් ලෙසින් සැලකිය නොහැකි ද ? එසේ සලකන්නේ නම්, පහත දැක්වෙන සිලෝන් ටුඩේ සහ මව්බිම පුවත් වාර්තාවන් එම පිළිතුරු දීමේ අවස්ථාවට සාධාරණය ඉෂ්ට කර ඇතැයි සැලකිය හැකි ද?

දෙවැනි කාරණය සිලෝන් ටුඩේ සහ මව්බිම පුවත් වාර්තාවන්හි සිරස්තලයන් සඳහා භාවිත වී ඇති භාෂාවයි. එම භාෂා භාවිතය යෝග්‍ය වන්නේද නොවන්නේද යන්න සම්බන්ධයෙන් පක්ෂ හා ප්‍රතිපක්ෂ අදහස් තිබිය හැක. ඉහත දැක් වූ පළමු කරුණ ද සමඟින් ගත් විට, මෙම සිරස්තලයේ අපහාසාත්මක ස්වරයක් ගැබ්ව තිබේ ද? එසේ නැතිනම් එය ප්‍රකාශනයේ නිදහස වන්නේ ද? මේ පිළිබඳව ඔබගේ පිළිබඳ ඔබගේ අදහස කුමක්ද?